කටුනායක සීදූව නගර සභාව
--------------------------------
ගම්පහ දිස්ත්‍රික්කය
--------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 23 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කටුනායක සීදූව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව නිශ්චිතව හඳුනාගත නොහැකි ආදායම් හා වියදම් මුදල් පදනමට ගිණුම් තැබිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ මුද්දර ආදායම උපචිත පදනමට ගිණුම් තැබීම නිසා ලැබිය යුතු මුද්දර ආදායම් හා වර්ෂයේ ආදායම රු.1,051,250 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් ප්‍රතිපත්තිවලට අනුව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුවේ. | මෙම මුද්දර ආදායම වන රු.1,051,250 ක් 2020 ජනවාරි මස ලැබී ඇති බව දන්වමි. |

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගිණුම් සැකසීමේදී ඉඩම් 29 ක් තක්සේරු කර ගිණුම්ගතකර තිබුණි. | සභාව සතු සියළු වත්කම් හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී විමසුමට අදාල අනෙකුත් ඉඩම් තක්සේරු කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයේ භෞතික තොගය භෞතික තොගය ගිණුම්වලට නොගෙන රු.8,917,189 ක් වූ පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | භෞතික තොගය හා පොත් තොගය සසඳා ගැලපුම් ගිණුමක් පිළියෙල කළ යුතුවේ. | පොත් අගය හා භෞතික තොගය මාසිකව සැසඳීමක් කරන බැවින් එම ගිණුම සකස් නොකරන බව දන්වමි. |

1.3.3 නොසැසඳුණු ගිණුම්
-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයන් 04 ක ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.7,664,336 ක වෙනසක් විය. | උපයෝගී ලේඛන හා ගිණුම් ශේෂ සසඳා ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.3.4 අවිනිශ්චිත ගිණුම
---------------------

ඉකුත් වර්ෂයේ අවසන් ගිණුම්වල දක්වා තිබූ රු.12,051,288 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කර තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ හිඟ හිටි වරිපනම් ගිණුමේ කපා හැරීම් රු.2,366,571 ක් තුළ හඳුනා නොගත් වටිනාකම රු.97,644 ක් විය. | හඳුනා නොගත් ශේෂ හඳුනා ගැනීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2016 වර්ෂයේ ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ගිණුමෙහි මුදල් ලැබීම් හා සත්‍ය ලැබීම් අතර රු.13,484,349 ක වෙනසක් පැවතියද සංශෝධිත ගිණුම තුළ රු.12,760,606 ක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් රු.723,743 ක වෙනස සඳහා සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | වටිනාකම් සනාථ කෙරෙන තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට වෙනත් ආදායම් හිඟය ලෙස දක්වා තිබූ රු.625,052 ක වටිනාකමක් තහවුරු කර නොතිබුණි. | ගිණුම්ගත කර ඇති හිඟ ආදායම් තහවුරු කර ගත හැකි තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | රු. | | | |
| 2018 ජූලි 19 දිනැති අංක 2108/e-Local Government-01 දරන බස්නාහිර පලාතේ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | - | අන්තර්ජාලය හරහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට හා ගෙවීම් සිදු කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා නොතිබුණි. | අන්තර්ජාල පහසුකම් මගින් ජනතාවට සේවය සලසා දිය යුතුවේ. | මේ සම්බන්ධයෙන් කටයුතු කරන බවත් වෙබ් අඩවියක් නිර්මාණය කිරිම සඳහා ටෙන්ඩර්කරුවෙකු තෝරාගෙන ඇති බවත් දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.149,282,566 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 64.410,937 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. |
| (i) | වරිපනම් හා බදු | 106,868 | 110,822 | 103,496 | 28,501 | 106,309 | 110,112 | 98,850 | 11,261 |
| (ii) | කුලී | 10,635 | 10,011 | 12,511 | 408 | 11,325 | 12,734 | 12,396 | 338 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 9,301 | 5,259 | 6,563 | - | 2,151 | 2,703 | 2,703 | - |
| (iv) | වෙනත් ආදායම් | 157,487 | 1,028 | 128,109 | 12,118 | 59,359 | 44,986 | 44,788 | 10,976 |
| | | 284,291 | 127,120 | 250,679 | 41,027 | 179,144 | 170,535 | 158,737 | 22,575 |

2.2.2 වරිපනම් හා බදු

-----------------

(අ) වරිපනම්

----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයටද වරිපනම් අය කර තිබුණි. | වසර 5 කට වරක් තක්සේරු සංශෝධනය කිරිමට කටයුතු කළ යුතුවේ. | දැනට 2009 වර්ෂයේ තක්සේරුව අනුව වරිපනම් අයකර තිබූ අතර සභා තීරණයක් මත විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ඇතිව ව්‍යාපාර සඳහා සියයට 15 ක්ද ගෘහස්ථ සඳහා සියයට 4 ක් ද අයකරනු ලබන බව දන්වමි. |

(ආ) ව්‍යාපාර බදු

------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා බල ප්‍රදේශයේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන රක්ෂණ නියෝජිත ආයතන, කිසිවකින් ව්‍යාපාර බදු අයකර නොතිබුණි. | සභා බල ප්‍රදේශය තුල ඇති ව්‍යාපාර ආයතනවලින් යාවත්කාලීනව ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වර්තමානයේ අයකර ගෙන ඇති බව දන්වමි. |

2.2.3 බලපත්‍ර ගාස්තු

---------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතෙහි විධිවිධාන ප්‍රකාරව සංචාරක මණ්ඩල පනත යටතේ ලියාපදංචි අවන්හල් තානායම් හා හෝටල්වලින් පසුගිය වර්ෂයේ මුළු පිරිවැටුමෙන් සියයට 1 දක්වා වූ ගාස්තුවක් අයකළ හැකි වුවත් සමාලෝචිත වර්ෂයේදී ඊට පටහැනිව නාගරික සභා බල ප්‍රදේශයේ තානායම් හා හෝටල් 07 කින් කාමර පදනම මත වාර්ෂික ගාස්තුවක් අයකර තිබුණි. | මුළු පිරිවැටුම මත පදනම්ව වාර්ෂික ගාස්තු අයකිරීම කළ යුතුවේ. | නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව 2020 වර්ෂයේ සිට එම ක්‍රියාවලිය නිවැරදි කර ඇති බව දන්වමි. |
| (ආ) | නගර සභා බල ප්‍රදේශය තුළ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යනු | පරිසර බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කළ | පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගන්නා ලෙස ලිපි මඟින් |

| | | |
|---|---|---|
| ලබන ව්‍යාපාර හා කර්මාන්ත ආයතන 16 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ පරිසර බලපත්‍ර නිකුත් කර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | යුතුවේ | දැනුවත් කර ඇති අතර මේ වන විට ආයතන 05 ක් බලපත්‍ර ලබාගෙන ඇති බව දන්වමි. |

2.2.4 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගාස්තු අය කිරීමකින් තොරව සභාවේ කසළ අංගනයට කසළ බැහැර කිරීමට ඉඩ සලසා තිබූ අතර නගර සීමා බල ප්‍රදේශය තුළ ව්‍යාපාරික ආයතන 03 කින් පමණක් ගාස්තු අය කර ගෙන තිබුණි. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ රීති අනුව ගාස්තු අයකිරීම කළ යුතුවේ. | 2020 වසරේදි එසේ කසළ ගෙන එනු ලබන පෞද්ගලික වාහන නවතා ඒ සඳහා දිනකට රු.8000 ක මුදලක් අයකර සභාව සතු ට්‍රැක්ටර් මඟින් කසළ ප්‍රවාහනය කරනු ලබන බව දන්වමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබවිහරණය පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

3.1 කාර්යසාධනය

(අ) වාර්ෂික කාර්ය සාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ අදාළ කර ගත යුතු ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවියක් හරහා ලබා දී, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සැපයීම, පාරිභෝගිකයින්ට හිතකර සේවාවක් සැපයීම සඳහා පෙරටු කාර්යාලයක් හා පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් හඳුන්වා දීම යන අවශ්‍යතාවයන් සපුරා නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම අනුව පෙරටු කාර්යාලයක් හා පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් පිහිටුවිය යුතුවේ. | කාර්යාල ගොඩනැගිලි පරිශ්‍රය තුල ඉඩ පහසුකම් නොමැති බැවින් පැරණි ගොඩනැගිල්ල අළුත්වැඩියාවෙන් පසුව පෙරටු කාර්යාලයක් සකස් කරන බව දන්වමි. |

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කසළ අංගනයේ කටයුතු සඳහා යොදවා ගෙන තිබූ බැකෝ යන්ත්‍රය වර්ෂය පුරාම අඛණ්ඩව භාවිතා නොකිරීම හේතුවෙන් කසළ බාහිර පරිසරයට නිරාවරණය වීම නිසා පරිසරයට දැඩි බලපෑමක් සිදුව තිබූ අතර 2020 පෙබරවාරි 20 දින කසළ අංගනයේ ගිනි ගැනීමක් හේතුවෙන් පරිසරයටද දැඩි බලපෑමක් සිදුව තිබුණි. | කසළ අංගනයේ පාරිසරික හානි අවමවන ආකාරයට පවත්වා ගත යුතුවේ. | කසළ අංගනයේ කසළ තුනී කිරීම සඳහා විශාල කුලී මුදලක් ගෙවීමට සිදුවන බැවින්, කසළ අංගනය නිතිපතා නිසි පරිදි නඩත්තු කිරීම සඳහා D5D යන්ත්‍රයක් සභාව මඟින් මිලදී ගැනීම සඳහා ඇනවුම් ලබා දී ඇති බවද දන්වමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

3.2.1 සේවක ණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ සේවය කරන සේවකයන් දෙදෙනෙකුගෙන් හා ස්ථාන මාරුවී ගිය නිලධාරින් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.126,086 ක් හා විශ්‍රාම ගොස් තිබූ නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.158,314 ක ණය ශේෂයක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාන මාරුවී ගිය හා විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අය විය යුතු ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ස්ථාන මාරුවී ගිය හා විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අය විය යුතු ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභා බල ප්‍රදේශයේ ප්‍රවාහන සේවා කටයුතු පවත්වාගෙන යනු ලබන ත්‍රීරෝද රථ සංගම් ලියාපදිංචි කර ගාස්තු පැනවීමට පියවර ගෙන නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම තුලින් ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2015 සැප්තැම්බර් 22 වන දින බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් සම්මත කරන ලද අතුරු ව්‍යවස්ථාව 2020 පෙබරවාරි 28 දින පැවති මහ සභාවේදී මෙම බල ප්‍රදේශයට අදාල කර ගැනීමට යෝජනා සම්මුතියක් රැගෙන ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු කරන බව දන්වමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 භාණ්ඩ සමීක්ෂණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් පර්චස් 21 ක්වූ කටුනායක පිහිටි අඹගහවත්ත කටුනායක ඉඩමද, පර්චස් 21 ක්වූ අමන්දොළුව පිහිටි ගොරකගහකුඹුර ඉඩම හා ට්‍රැක්ටර් ටේලර් 07 ක්ද සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී සොයා ගත නොහැකි ලෙස සඳහන් කර තිබුණි. | සභාව සතු වත්කම් ආරක්ෂා කර ගැනීමට හා නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පැහැදිලි සැලසුමක් හෝ ඔප්පු සොයාගත නොහැකි වීම හේතුවෙන් ඉඩම සොයාගත නොහැකි තත්වයක් පවතින අතර ඉඩම් කච්චේරිය මඟින් විස්තර සොයා ඉදිරි කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇති බවත් පර්චස් 40 ක් වූ අමන්දොළුව පිහිටි ගොරකගහකුඹුර ඉඩම වෙනුවෙන් අල්ලස් හා දූෂණ විමර්ශණ කොමිෂන් සභාව මගින් පරීක්ෂණයක් පවත්වාගෙන යනු ලබන අතර ඉදිරියේදී එම විධිවිධාන අනුව කටයුතු සිදු කරනු ඇති බව මෙයින් දන්වමි. |
| (ආ) | සභාව සතු ලෙස හඳුනාගෙන තිබූ ඔප්පු හෝ සැලසුම් නොමැති ඉඩම් 27 ක් විය. | සභාව සතු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම ඉඩම් නගර සභාව මඟින් දීර්ඝ කාලීනව භුක්ති විඳින ලබන ඉඩම් වන අතර සභාවේ එකඟතාවය විමසා ප්‍රකාශන ඔප්පු සකස් කිරීමට උපදෙස් ලබා දී ඇති බව දන්වමි. |

## 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට පුස්තකාල පොත් මිලදී ගැනීමේදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයේ 9.4.1 අනුව ප්‍රකාශකයාගෙන් මිලදී නොගැනීම නිසා ලැබිය යුතු සියයට 20 වට්ටම සියයට 10 ක් වීමෙන් සභාවට රු.59,641 ක පාඩුවක් සිදුවී තිබුණි.පොත් මිලදී ගෙන තිබුණේ පොත් ප්‍රකාශන සමාගම් දෙකකින් පමණක් වන අතර එම සමාගම් දෙක තෝරා ගැනීම සඳහා කිසිදු ප්‍රසම්පාදන පිළිවෙතක් අනුගමනය කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවේ | ප්‍රදේශයේ පාසල් 10 කින් අවශ්‍ය පොත් සඳහා යෝජනා ලබාගෙන ඇත. බොහොමයක් පොත් පුස්තකාලයේ දැනට පවතින බැවින් පාසල් වලින් ලැබී ඇති යෝජනා වලින් සියයට 25 ක පමණ ප්‍රමාණයක් මිලදී ගත් බව දන්වමි. |